# Project 58
# 58 වන ව්‍යාපෘතිය

DP EDUCATION

## Coding School






LIVEWORKSHEETS

Google Translate App එක නිර්මාණය කරමු.

එහි,

Drop down එක මඟින් Translate කල යුතු language එක select කර ගන්න.

English හෝ සිංහල select කර Text area එකෙහි පරිවර්තනය කල යුතු වචනය හෝ වාක්‍ය ඇතුලත් කර Translate button එක click කරන්න. එවිට ආදාල language එකට අනුව එම වචනය හෝ වාක්‍ය translate වී new tab තුල google translate side එක display විය යුතුය.





- ❖ ඔබට අවශ්‍ය පසුබිම හා මුලික දෑ සපයා ඇත.
- ❖ දැන් "Detect Language" සඳහා label එක හා "English" හෝ "සිංහල" select කිරීම සඳහා drop down එක design කරන්න.
- ❖ Text area එකක් drag කර පහත පරිදි properties ලබා දෙන්න.




LIVEWORKSHEETS

❖ "Translate"ලෙස button එකක් නිර්මාණය කර පහත පරිදි properties ලබා දෙන්න.







❖ Button එක click කල විට මුලින් ම drop down එකේ select කර ඇති language එක "language" variable එකට assign කර ගන්න.

❖ Text area එකෙහි ඇති value එක "search" variable එකට assign කර ගන්න.

❖ "google" ලෙස variable එකක් නිර්මාණය කරන්න.

❖ Drop down එකේ select කර ඇති language එක "English" නම් අප Text area එක තුල ලබා දෙන වචනය හෝ වාක්‍ය, "Translate" button එක click කල විට සිංහල වලට පරිවර්තනය කල යුතුය.

❖ English වචනයක් හෝ වාක්‍ය, සිංහල වලට පරිවර්තනය කිරීමට "Google Translate" web side එක use කර ගනිමු. එහි url එක පහත පරිදි වේ.

https://translate.google.com/?sl=en&tl=si&text=school&op=translate

මෙහි පළමු සමාන ලකුණ හා "&" ලකුණ අතර ඇති "en" මගින් English භාෂාව ද, දෙවන සමාන ලකුණ හා "&" ලකුණ අතර ඇති "si" මගින් සිංහල භාෂාව ද නිරූපණය කරයි.

මෙහිදී Translate කල යුතු වචනය රතු පාටින් කොටු කල ඇති කොටසට ලබා දිය යුතුය.

ඒ අනුව පළමු සමාන ලකුණ හා "&" ලකුණ අතර ඇත්තේ ඔබ ඇතුලත් කරන වචනය හෝ වාක්‍ය භාෂාව වන අතර පරිවර්තනය කල යුතු භාෂාව දෙවන සමාන ලකුණ හා "&" ලකුණ අතර වේ.

LIVEWORKSHEETS

❖ සිංහල වචනයක් හෝ වාක්‍ය, English වලට පරිවර්තනය කිරීමට “Google Translate” web side එක use කර ගනිමු. එහි url එක පහත පරිදි වේ.

https://translate.google.com/?sl=si&tl=en&text=පාසල&op=translate

❖ ඉහත url අධ්‍යයනය කල විට තෙවන සමාන ලකුණ හා “&” ලකුණ අතර ඇති කොටසට එනම් රතු පාටින් කොටු කල ඇති කොටසට පරිවර්තනය කල යුතු වචනය හෝ වාක්‍ය ඇතුලත් කල යුතු බවයි.

https://translate.google.com/?sl=si&tl=en&text=පාසල&op=translate

❖ ඉහත url එකෙහි කොළ පාටින් කොටු කර ඇති කොටස් default ලෙස ලබා දී පරිවර්තනය කල යුතු වචනය හෝ වාක්‍ය “search” variable එකට assign කර එය පහත පරිදි Drop down එකේ select කර ඇති language අනුව ලබා දෙන්න.


```
onEvent("button", "click", function( ) {
  var language = getText("dropdown1");
  var search = getText("text_area1");
  var google;
  textLabel("id", "text");
  if(language == "English"){
    google = "https://translate.google.com/?sl=en&tl=si&text=" + search + "+&op=translate";
  }
  else{
    google = "https://translate.google.com/?sl=si&tl=en&text=" + search + "+&op=translate";
  }
  open(google);
});
```

නිවරදි පිළිතුර තෝරන්න.

1. මෙම App එක design කිරීමේදී දමිළ භාෂාව (Tamil) ඇතුළත් කිරීම සඳහා කල යුත්තේ කුමක්ද?
   “dropdown1” සඳහා Tamil ලෙස options එකක් එක් කිරීම.
   “label1” හි Tamil ලෙස සටහන් කිරීම.
   “text_area1” හි Tamil ලෙස සටහන් කිරීම.

LIVEWORKSHEETS

2. ඔබ සටහන් කරන Tamil වචනයේ සිංහල තේරුම දැන ගැනීමට යෙදිය යුතු blocks මොනවාද?










3. Search variable එක මඟින් පෙන්නුම් කරන්නේ කුමක්ද?

"dropdown1" හි ඔබ තෝරන භාශාව පෙන්නුම් කරයි.
"text_area1" හි ඔබ සටහන් කරන වචනය පෙන්නුම් කරයි.
"label1" හි සටහන් වචනය පෙන්නුම් කරයි.

4. මෙම App එක design කිරිමේදී ඔබ විසින් වචන type කරන කොටස සඳහා භාවිතා කර ඇති design tool එක කුමක්ද?




5. සිංහල වචනයක්, දමිල භාෂාවට පරිවර්තනය කිරිමට "Google Translate" web side එකේ url එක පහත පරිදි වේ.

"https://translate.google.com/?sl=si&tl=ta&text= පාසල&op=translate"

LIVEWORKSHEETS

පරිවර්තනය කල යුතු වචනය හෝ වාක්‍ය word ලෙස variable එකක් නිර්මාණ කර එයට assign කර ඇතැයි සිතන්න. ඉහත url එක හා word ලෙස variable යොදා ගනිමින් වචනය පරිවර්තනය කිරීමට යෙදිය යුතු blocks මොනවාද?

```
google = ("https://translate.google.com/?sl=si&tl=ta&text=" + word + "+&op=translate");
```

```
google = ("https://translate.google.com/?sl=si&tl=ta&text=" + "+&op=translate" + word);
```

```
google = ("https://translate.google.com/?sl=si&tl=ta&text= + word +&op=translate");
```

LIVEWORKSHEETS